මාවනැල්ල ප්‍රාදේශීය සභාව
කෑගල්ල දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 10 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 10 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වරයාගේ වාර්තාව 2016 මැයි 31 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය.
-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.
-----------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත 04 කට අදාලව රු. 46,392 ක මුදලක් ණයහිමියන් යටතේ අධි ප්‍රතිපාදන සැලසීම නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.46,392 ක් අඩුවෙන් හා 2015 දෙසැම්බර් 31 දිනට ණයහිමි ප්‍රතිපාදනය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි .

(ආ) ස්ථාවර වත්කම් ලේඛනයේ සඳහන් අංක 46-8326 දරන රු.90,100 ක් වටිනා වෛලරය ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත නොකිරීම නිසා එම ප්‍රමාණයෙන් ස්ථාවර වත්කම් අඩුවෙන් හා ප්‍රාග්ධනයෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) 2014 හා 2015 වර්ෂවල පුස්තකාල පොත් මිලදී ගැනීමේදී ලැබී තිබූ මුළු වට්ටම් මුදල වන රු. 103,157 ක් සමාලෝචිත වර්ෂයේ වියදම් හා ආදායම් පාලන ගිණුම් වලට හර හා බැර කර තිබුණි.

(ඈ) ළමා උද්‍යාන පොදු වැසිකිළියේ 2014 අප්‍රේල් මාසයට අදාල රු.256,069 ක් වූ හිඟ ජල ගාස්තු වෙනුවෙන් ණය හිමියන් යටතේ ප්‍රතිපාදන සලසා නොතිබුණි.

1.3.2 නොසැසඳු පාලන ගිණුම්.

-----------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව සේවකණය ගිණුමේ ශේෂය 9,540,221ක් වූ අතර උපයෝගී ලේඛන / වාර්තා අනුව ශේෂය රු.9,457,115 ක් වූයෙන් රු. 83,106 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්.</u>

(අ) සමාලෝචිත වර්ෂය අවසානයටලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 63,572,934 ක් වූ අතර ඉන් රු.10,847,237 ක් වසරකට වඩා පැරණි ශේෂයන් විය.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයටගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.51,296,801 ක් වූ අතර ඉන් රු. 15,885,000 ක් වසරකට වඩා පැරණි ශේෂයන් විය.

2. මූල්‍ය සමාලෝචනය

------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල.

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.30,295,596ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.23,521,628 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.6,773,968 ක වර්ධනයක් දක්නට ලැබුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

------------------------------------

මූල්‍ය ප්‍රතිඵලය රු.6,773,968 ක වර්ධනයට ආදායම් විෂයයන් 05 ක වැඩිවීම හා වියදම් විෂයයන් 04 ක අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි

2.3 ආදායම් පරිපාලනය

-----------------------

2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

----------------------------------------

ලේකම්වරිය විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ බිල්කල ආදායම ,තථ්‍ය ආදායම හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ

2015.12.31 දිනට හිගය

| ආදායම් ප්‍රභවය | 2015 ජන 01දිනටහිහය රු. | 2015 දෙසැ 31 දිනට හිගයෙන් අයකිරීම රු | 2015 වර්ෂයේ බිල් කිරීම් රු | වර්ෂයේබිල් කිරීම්වලින් අයවීම රු | 2015 ජන 01 දිනට පැවති හිගයෙන රු | වර්ෂයේ බිල් කිරීම් වලින් හිගය රු | මුළු හිගය රු |
|---|---|---|---|---|---|---|---|
| | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 |
| (I)වරිපනම් හා බදු | 15,286 | 7,156 | 11,757 | 6,009 | 8,130 | 5,748 | 13,878 |
| (ii) බදු කුලී | 1,874 | 146 | 15,910 | 15,895 | 1,728 | 15 | 1,743 |
| (ii) බලපත්‍ර ගාස්තු | 177 | 51 | 1,400 | 1,400 | 126 | - | 126 |
| (iv)වෙනත්ආදායම් | 33,278 | 27,255 | 82,810 | 42,662 | 6,023 | 40,148 | 46,171 |

ඉහත ආදායම් තොරතුරු මුල්‍ය ප්‍රකාශණ අනුව සැසඳීමේදී පහත වෙනස්කම් නිරීක්ෂණය විය.

| ආදායම් ප්‍රභවය | හිග ආදායම් තොරතුරු අනුව ශේෂය | මුල්‍ය ප්‍රකාශණ අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 13,878 | 13,715 | 163 |
| වෙනත් ආදායම් | 46,171 | 48,428 | 2,257 |

### 2.3.2 බදු කුලී

2002 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාලයට අදාලව මස් කඩ කාමර 18 කින් හා මාළුකඩ කාමර 03 කින් හිඟ කුලී වශයෙන් අයකල යුතු එකතුව රු.1,081,031ක හිඟ මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.3.3 දැන්වීම් පුවරු ගාස්තු

දැන්වීම් පුවරු ලේඛනය අනුව ස්ථිර දැන්වීම් පුවරු 34 ක් සඳහා පමණක් ගාස්තු අයකර ගෙන තිබුණද මීට අමතරව සභාවේ සිට කොළඹ- නුවර මාර්ගයේ කඩුගන්නාව දක්වා පමණක් විශාල ප්‍රමාණයේ ස්ථිර දැන්වීම් පුවරු 52 ක් පවතින බව 2015 නොවැම්බර් 3 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය වුවද, ඒ සම්බන්ධ සමීක්ෂණයක් සිදුකර ගාස්තු අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

### 2.3.4 බලපත්‍ර ගාස්තු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ

(අ) 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහයේ රීති අංක 59 හා රීති අංක 61 ප්‍රකාරව සෑම වර්ෂයක් ආරම්භයේදීම වෙළඳ බලපත්‍ර කර්මාන්ත බදු හා වෘත්තීන් සම්බන්ධයෙන් සමීක්ෂණයක් පවත්වා ලේඛන පිළියෙල කර ගෙන එම ලේඛන ප්‍රකාරව බදු අයකරගත යුතු වුවත් , නිකුත් කරන ලද බලපත්‍ර වලට අදාල කර්මාන්ත, වෙළඳ, ව්‍යාපාර වෘත්තීන් පමණක් බදු ලේඛන වල ඇතුළත් කර තිබුණි.

(ආ) 2015 වර්ෂයට අදාලව වෙළඳ බලපත්‍ර 464 ක් නිකුත් කර තිබුණද වාර්ෂික සමීක්ෂණයෙන් හඳුනාගත් ප්‍රමාණය 381 ක් විය.

2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේක්ම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| (i) උසාවි දඩ | 1,416,500 |
| (ii) මුද්දර ගාස්තු | 28,263,245 |

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) නීත්‍යානුකූලව අත්පත්කර ගැනීමකින් තොරව මාර්ගය පුළුල් කිරීමට යාමේදී ආරක්ෂක බැම්මක් , ගේට්ටුවක් හා බෝක්කුවක් කඩා දමා පර්චස් 2.62 ක බිම් ප්‍රමාණයක් මාර්යට ඈඳාගෙන ඇති බවට තීරණය කළ අධිකරණය එමඟින් විත්තිකරුට සිදුවූ අලාභයට රු.425,120 ක වන්දි මුදලක් හා රු.23,250 ක නඩු ගාස්තුවක් ගෙවන ලෙසට ප්‍රාදේශීය සභාවට නියෝග කර තිබුණි. මෙම සිද්ධියට වගකිවයුතු නිලධාරින්ගෙන් මෙම ගාස්තු අයකරගත යුතු බවට සබරගමුව පළාත් පාලන කොමසාරිස්ගේ 2014 ජුලි 30 දින අංක සීඑල්ජී/7/3/5/5 දරන ලිපිය මගින් සභාවට දැනුම් දී තිබුණද එම තීරණය ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) 2013 ජනවාරි 07 වැනි දින සිට 2015 ඔක්තෝබර් 21 වැනි දින දක්වා හඳුනාගත් අනවසර ඉදිකිරීම් සංඛ්‍යාව 65 ක් වූ අතර අනවසර ඉදිකිරීම් සම්බන්ධව ස්ථානීය පරීක්ෂණයක් සිදුකර අදාල වාර්තා ඉදිරිපත් කරන ලෙසට කාර්මික නිලධාරිට යොමුකර තිබුණද පරීක්ෂණ වාර්තා ඉදිරිපත් නොකළ අවස්ථා 20 ක් පැවතුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සබරගමුව පළාත් සභාව මඟින් ප්‍රාදේශීය සභාවේ සැළසුම් ශිල්පිනිය 2003 මාර්තු මස සිට ද, ආදායම් පරිපාලකවරයා මැයි මස සිට ද, ස්ථාන මාරුකර තිබුණද සේවයෙන් නිදහස් නොකර රඳවාගෙන තිබුණු බැවින් එම දෙදෙනාගේ වැටුප් ප්‍රතිපූරණය නොකරන බවට පළාත් සභාව දැනුම් දී තිබුණි. ඒ අනුව 2003 වර්ෂයේදී මෙම නිලධාරින් දෙදෙනා සඳහා වැටුප් වශයෙන් ගෙවන ලද රු.152,140 ක මුදලක් 2016 මාර්තු 28 විගණන අවස්ථාව වන විටත් ප්‍රතිපූරණය කරගෙන නොතිබුණි.

(ආ) සේවයේ ස්ථිර කළ සේවකයින් 22 ක් සඳහා වැන්දඹු හා අනත් දරු විශ්‍රාම වැටුප් දායකය වශයෙන් රු.47,187 ක් ගෙවිය යුතු වුවත් රු.18,560 ක් පමණ ගෙවා තිබුණි.

(ඇ) විශ්‍රාම වැටුප් සහිත ස්ථිර සේවයේ නියුතු සේවකයින් 17 ක් සඳහා 2014 ඔක්තෝබර් 24 දින සිට 2015 ජනවාරි 31 දින දක්වා කාලය වෙනුවෙන් සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට ගෙවන ලද රු.226,690 ක් වූ සභා දායකය ආපසු අය කරගැනීමට කටයුතු කර නොතිබුණි.

3.3 කොන්ත්‍රාත් පරිපාලනය
-----------------------------

(අ) 2014 දෙසැම්බර් 02 දින රු.164,500 ක මුදලක් මහවත්ත වාහන සේවා ස්ථානය ඉදිකිරීමේ කර්මාන්තය සඳහා ද්‍රව්‍ය හා ශ්‍රමය ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම්කර තිබුණි. 2015 නොවැම්බර් 09 දින සිදුකරන ලද භෞතික පරීක්ෂණයේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) කර්මාන්තයේ වැඩ 2014 නොවැම්බර් 20 දින නිමකර තිබූ නමුත් වාහන සේදීම් සඳහා භාවිතා කර නොතිබුණි.

(ii) වාහන සේදීම සඳහා අවශ්‍ය උපකරණ කිසිවක් සවිකර නොතිබූ අතර සේදීම් ස්ථානය නඩත්තු නොකර වල් බිහිවීමට ඉඩහැර තිබුණි.

(iii) වාහන සේදුම් ස්ථානයෙන් පිටකරන අපිරිසිදු ජලය ගබඩා කිරීම සඳහා පිරිපහදු ටැංකියක් හෝ වෙනත් පරිසර ආරක්ෂිත ක්‍රමයක් ස්ථාපිත කර නොතිබුණි. අපිරිසිදු ජලය , පානීය ජල මූලාශ්‍රයක් වූ මාඔය ට ගලා යාමට ඉඩ සළසා තිබීම හේතුවෙන් පාරිසරික හා සෞඛ්‍ය ගැටළු ඇතිවීමේ අවදානමක් පැවතිනි

(ආ) මාවනැල්ල ළමා උද්‍යානය අසල පැතිබැම්ම ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සභාවේ ඍජු ශ්‍රමදායකත්වය යටතේ ඉදි කළ අතර එහි වැඩ විෂය අංක 03 යටතේ පැති බැම්ම ඉදිකිරීම වෙනුවෙන් සිමෙන්ති සඳහා රු. 56,960 ක් ද වැලි සඳහා රු. 29,045 ක් ද කළුගල් සඳහා
රු. 19,734 ක් ද එකතුව වශයෙන් රු.108,739 ක් වැඩිපුර වැයකර තිබුණි.

3.4 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
----------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාවේ කසල කළමනාකරණ මධ්‍යස්ථාන භූමියට ගලි බවුසරය මඟින් රැගෙන එන මළ ද්‍රව්‍ය බැහැර කිරීමේදී දීර්ඝ කාලයක සිට ප්‍රයෝජනයට ගන්නා අනාරක්ෂිත වල උතුරා යාමට ආසන්නව තිබුණු අතර සුළු වර්ෂාවකදී පවා උතුරා කසල කළමනාකරණ මධ්‍යස්ථාන භූමිය ආසන්නයෙන් මාඔයට ගලා යාමේ අවධානමක් පැවතුණි. මෙම මළ ද්‍රව්‍ය කසල කළමනාකරණ මධ්‍යස්ථාන භූමියටගලා යාමෙන් එහි කටයුතු අඩාල වීමටත්, පරිසරයට විවෘතව පැවතීමෙන් සේවයේ නියුතු සේවකයින්ගේ සෞඛ්‍යයට තර්ජනයක් ඇතිවීමටත් හේතු වීතිබුණි.සභාව සතුව ගලි බවුසර් දෙකක් තිබුණද පෞද්ගලික ආයතන වලට සහ පුද්ගලයින්ට ගලි සේවාව සැපයීම 2015 වර්ෂයේදී සීමා කර තිබුණි.

(ආ) පොහොර නිෂ්පාදනයේදී භාවිතා කරනු ලබන බොබ් කැට් යන්ත්‍රය වර්ෂයකට වැඩි කාලයක් තුළ භාවිතා නොකර කසල කළමනාකරණ මධ්‍යස්ථාන භූමියේ නිශ්කාර්යව තබා තිබුණි.

(ඇ) පොහොර නිෂ්පාදනයට අවශ්‍ය ජලය එම භූමියට ලබාගෙන නොතිබූ බැවින් නිසි පරිදි පොහොර නිෂ්පාදනය සිදු නොවූ බව නිරීක්ෂණය විය.

3.5 පාරිසරික ගැටළු

---------------------

කසල කළමනාකරණ මධ්‍යස්ථානයට දෛනිකව කසලටොන් 20 ක් පමණ ලැබී තිබුණද පොහොර නිෂ්පාදනයට ගනුලබන කසල ප්‍රමාණය ටොන් 07 ක් පමණ බවත් ඉතිරිය පුළුස්සා දමන බවත් නිරීක්ෂණය වූ අතර පොලිතින් අධිකව තිබුණු බැවින් එය පරිසරයට හානිදායක බව 2016 මාර්තු 25 දින කරන ලද භෞතික පරික්ෂාවේදී නිරීක්ෂණය විය.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

----------------------------------------

4.1 අයවැය පාලනය.

--------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනයෙන් ප්‍රතිපාදන සලසා තිබුණු වැය විෂයන් 22 ක එකතුව වූ රු.203,549,000 ක ප්‍රතිපාදන 100% ක් ද වැය විෂයන් 06 ක එකතුව වූ රු.777,182 ක ප්‍රතිපාදන වලින් 55% ත් 95% ත් අතර ද වශයෙන් එකතුව රු.204,326,182 ක් සහා කටයුතු සඳහා යොදාගෙන නොතිබුණි.

(ආ) ආදායම් විෂයයන් 06 ක ඇස්තමේන්තුගත ආදායම රු. 3,825,000 ක් වූ අතර තථ්‍ය ආදායම රු.2,296,196 ක් විය. අයවැයගත ආදායමට සාපේක්ෂව එකී ආදායම් ශීර්ෂ වල ආදායම් අය කිරීමේ විචලනය 33% සිට 69% දක්වා පරාසයකින් අඩුවී තිබුණි.

(ඇ) වැය විෂයන් 14 ක් සඳහා රු.7,128,000 ක ප්‍රතිපාදන මුදලින් රු.5,412,000 ක් බැගින් වැය විෂයන්ට මාරු කිරීමෙන් අනතුරුව රු.1,716,000 ක මුදලක් ඉතිරි වී තිබුණි.

(ඇ) වැය විෂයන් 04 ක් සඳහා ප්‍රතිපාදන මුදල් වන රු.910,000 ක් වර්ෂය තුළ වෙනත් වැය විෂයන්ට මාරුකර තිබුණි.

5. පද්ධති හා පාලන.

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) සණ අපද්‍රව්‍ය කළමනාකරණය